චක්‍රලේඛ අංක: 1/2012 — 2012.04.19

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්
හා පලාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් වෙත

## <u>වැඩිහිටි කමිටුවල සාමාජිකත්වය</u>

2000 අංක: 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල හා පලාත් වැඩිහිටි බලමණ්ඩලවල සාමාජිකත්වය හා ඒවායේ සියලු නිලතල සඳහා පත්කල යුතු වන්නේ අනිවාර්යයෙන්ම වයස අවුරුදු 60 හෝ එයට වැඩි වැඩිහිටි තැනැත්තන්ම පමණි.

වැඩිහිටියන්ගේ කැමැත්ත මත වයස අවුරුදු 60ට අඩු එහෙත් ඊට ආසන්න වයස්වල තැනැත්තන්ට ද වැඩිහිටි සමිති කටයුතුවලට සහාය පිනිස ඒවාට සහභාගී විය හැකි නමුත්, සාමාජිකත්වය, නිලතල හෝ වැඩිහිටියන්ට හිමි වරප්‍රසාද කිසිවක් ඔවුනට හිමි නොවිය යුතුය.

ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ

පිටපත් : සියලුම වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන්/සමාජ සේවා නිලධාරීන්/
සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් - වැඩිහිටි කමිටු දැනුවත් කිරීම සඳහා